www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නෝර්ත්වෙස්ට් 253 ගුවන් ගමනේ ඔත්තු සේවා අකර්මන්‍ය වීම: නොසැලකිලිමත්කමක් ද නැත් නම් කුමන්ත්‍රනයක් ද?

**The Northwest Flight 253 intelligence failure: Negligence or conspiracy?**

**2009 දෙසැම්බර් 31**

23 හැවිරිදි නයිජීරියානු සිසුවෙකු වූ උමාර් ෆාරුක් අබ්දුල්මුතලබ් නෝර්ත්වෙස්ට් 253 ගමනේ යෙදුනු ගුවන් යානයතුල බෝම්බයක් පුපුරවා හැරීමට දැරූ ප්‍රයත්නය අසාර්ථක විය. එතැන් පටන් ගත වූ දින පහ තුල දී එලිමහනට ආ තොරතුරුවලින් ඇඟවෙන්නේ, එක්සත් ජනපද ඔත්තු හා ආරක්ෂක සේවාවන් එක්සත් ජනපද ආරක්ෂාව ද, ස්වභාවය සහ පරිමානය අනුව ගත් විට අසාමාන්‍ය, එහෙත් ප්‍රකට නොවූ අභ්‍යන්තර බිඳ වැටීමකට ලක්ව ඇති බව යි.

දැන ගන්නට ලැබී ඇති කරුනු අතර පහත දැක්වෙන ඒවා පවතී:

- අබ්දුල්මුතලබ්ගේ පියා විශ්‍රාම ලත් ප්‍රමුඛ පෙලේ බැංකුකරුවෙක් ද ආන්ඩුවේ හිටපු ඇමතිවරයෙක් ද වෙයි. බෝම්බය පිපිරවීමේ ප්‍රයත්නයට මාසයකටත් වැඩි කලකට කලින් අබුජාහි පිහිටි එක්සත් ජනපද තානාපති කාර්යාලයට ගිය ඔහු තම පුතු යේමනයෙහි සිටින අල් කයිඩා කන්ඩායම්වලට සම්බන්ධ වී ඇති බවට සීඅයිඒ නිලධාරීන්ට අනතුරු අඟවා තිබින. තරුනයා සිටින තැන සොයා ගැනීමට අදාලකර ගත හැකි තොරතුරු ද ඔවුන්ට සැපයූ ඔහු ඉන් පසුව අඩු ගනනේ දෙවතාවක් වත් දුරකථනයෙන් අමතා ඔවුන්ට යලි ඒ ගැන සිහිපත් කලේ ය.
- යේමනයෙහි සිටින අල් කයිඩා ක්‍රියාකාරීන් ත්‍රස්තවාදී ප්‍රහාරයක් සඳහා "නයිජීරියානුවෙකු" සූදානම් කරමින් සිටින බවට යේමනයෙන් ලැබී තිබුනු තොරතුරු, අඩු ගනනේ හාර මාසයකට ආසන්න කාලයක් එක්සත් ජනපද ඔත්තු සේවාවන් සතුව තිබින.
- සිදුවන්නට යන ප්‍රහාරය සූදානම් කිරීමේ හා ඒ සඳහා "නයිජීරියානුවෙකු" යොදා ගැනීම පිලිබඳ දුරකථන සාකච්ඡා හසු කර ගැනීමෙන් පසුව ජාතික ආරක්ෂක ඒජන්සිය සොයා ගත් තොරතුරුවලින් යේමනයෙන් ලද තොරතුරු තව දුරටත් සනාථ විය.

එමෙන් ම, ඩොලර් 2,800ක් වූ අබ්දුල්මුතලබ්ගේ ප්‍රවේශ පත්‍රයට ගෙවන ලද්දේ අත්පිට මුදලිනි; පෙනී යන පරිදි නම් අවසාන මොහොතේ දී ය. ඔහු ට්‍රාන්ස්ඇට්ලැන්ටික් ගුවන් යානයෙහි නැගී සංචාරයෙහි යෙදුනේ ගමන් බඩුවලින් (ලගේජයකින්) තොරව, පිටේ එල්ලා ගත් ගමන් මල්ලක් පමනක් ඇතිව ය.

ඊලඟට, එම යානයෙහි ම ගමන් ගත් මගියෙකු, වූ මිචිගන්හි නීතිඥයෙකු වන කර්ට් හැස්කල්ගේ කථාන්තරයක් ද පවතියි. මනාව හැඳ පැලඳ ගත් දකුනු ආසියානු මිනිසෙකු සමග අබ්දුල්මුතලබ් ඇම්ස්ටර්ඩෑම්හි පිහිටි ගුවන් සමාගම් ප්‍රවේශ පත්‍ර කවුන්ටරය වෙත ලඟා වනු තමන් දුටු බවත් තරුන නයිජීරියානුවා විදේශ ගමන් බලපත්‍රයකින් තොරව ගමන් කල යුතු යැයි ඔහු සමග සිටි මිනිසා "නෝර්ත්වෙස්ට්" ප්‍රවේශ පත්‍ර ඒජන්තවරයාට පැවසූ බවත් ඔහු කියා සිටියි.

"එයා සුඩානයේ කෙනෙක්, අපි නිතර ම මේක කරනවා," යි වැඩිහිටි මිනිසා ඒජන්තයාට කී බව හැස්කල් විස්තර කලේ ය. අනතුරුව ඒජන්තවරයා ඔවුන් ගුවන් සමාගමේ දේශීය කලමනාකරුගේ කාර්යාලය වෙත යොමු කල බව හේ පැවසී ය.

සාමාන්‍යයෙන් නම් අබ්දුල්මුතලබ් හට ගුවන් යානයට ගොඩවන්නට ඉඩ දීමට පෙර මේ කරුනුවලින් එකක් හෝ දැඩි සෝදිසියක් ඇතිවීමට තුඩුදිය යුතුව තිබුනි.

2001 සැප්තැම්බර් 11 දින ආසන්නයේ සිදුවූවාක් මෙන් යලි වතාවක් ආන්ඩුව ද මාධ්‍ය ද තොරොම්බල් කරමින් සිටින්නේ, මෙම අසාමාන්‍ය සියලු ප්‍රමාද දෝෂ හුදු නොසැලකිලිමත්කමක නැත් නම් "හිඩැස් පුරවා ගැනීමට අසමත් වීමක" ප්‍රතිඵලයක් ය යන පැහැදිලි කිරීම යි.

9/11 සිදුවීමෙන් අට වසරකට පසුව, එම ප්‍රහාරයන් වටා පැවති - ඇමරිකානු මිලිටරිවාදයේ පුපුරා

යාම යුක්ති සහගත කිරීම සඳහා යොදා ගැනුනු - එක ද ප්‍රශ්නයකට වත් තව ම පිළිතුරු නො දී තිබිය දී, 300කට ආසන්න ජනයාගේ ජීවිතවලට හානි වන්නට ගිය සිදුවීමක් යටපත් කිරීමේ ප්‍රයත්නය සඳහා මෙම සුලභ වාග් ව්‍යවහාරය යොදා ගැනීම ප්‍රමානවත් නොවනු ඇත.

"නෝර්ත්වෙස්ට්" බෝම්බ ප්‍රයත්නයේ සහ 9/11 ප්‍රහාරවල සාමාන්‍ය සැලැස්ම පුදුම එලවනසුලු ලෙස එකිනෙකට සමාන ය. ඒවායින් ඇඟවෙන්නේ ක්‍රියා පටිපාටියක් යැයි ද ඇතැම් විට කෙනෙකුට කිව හැකි ය. සිදුවීම් දෙකේදී ම, ඒවා සිදු කලේ යැයි චෝදනා ලැබ සිටින්නන් රටට ඇතුලු වන්නට ඉඩ ලද්දේ එක්සත් ජනපද රහස් ඔත්තු සේවාවල විමර්ශනයන්ට සහ පරීක්ෂනයන්ට ලක් වීමෙන් පසුව වන අතර, ඔවුන් ගුවන් යානාවලට නැග ගත්තේ, සැක කටයුතු යමක් පැවතුනොත් සාමාන්‍යයෙන් නොයෙකුත් ආරක්ෂක අනතුරු ඇඟවීමේ සංඥා නිකුත් විය හැකිව තිබූ කොන්දේසි යටතේ ය.

එදා මෙන් ම අදත්, මෙහි ඇතුලත් සියලු දේ අත්වැරදීම් හැටියට මහජනයා පිලිගත යුතු යැයි ආන්ඩුව ද මාධ්‍ය ද අපේක්ෂා කරයි. එහෙත් අබ්දුල්මුතලබ්ගේ සම්බන්ධකම් පිලිබඳව පුලුල් බුද්ධි අංශ පරීක්ෂනයක් පැවැත්වීමට අසමත් වීම තුල අඩංගු වන්නේ හුදු "අහිංසක" අත්වැරදීම් පමනක් යැයි - ඊට වඩා නරුම සහගත වූ කිසිවක් එහි අඩංගු නොවන්නේ යැයි - කිසිවෙකු පිලිගත යුත්තේ මන්ද?

මෙම සිදුවීම බැරෑරුම්ව විභාග කර බලන්නට නම් පහත ප්‍රශ්නය ඇසිය යුතු ය:

"නෝර්ත්වෙස්ට් ෆ්ලයිට් 253" ගුවන් යානය විනාශයට පත් වූයේ නම් කුමක් සිදු වනු ඇද්ද?

එවැනි මහා විනාශයකින් ජාත්‍යන්තරව ද එක්සත් ජනපදය තුල ද දැඩි අහිතකර බලපෑම් ඇති වන බවට කිසිදු සැකයක් නැත. එය ඔබාමා පාලනාධිකාරය බරපතල ලෙස අස්ථාවර කරනු ඇත, පාලක පන්තිය තුල සිටින අන්ත-දක්ෂිනාංශික කොටස් දේශපාලනිකව ශක්තිමත් කරනු ඇත, මුහුදින් එතෙර කෙරෙන මිලිටරි- ඔත්තු මෙහෙයුම් වඩාත් දැවැන්ත ලෙස ප්‍රසාරනය වීමකට ද රට තුල ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් දැඩි ලෙස සීමා කිරීමකට ද මග හෙලි කරනු ඇත.

ප්‍රයත්නය අසාර්ථක වූ තතු යටතේ පවා, ත්‍රස්තවාදය හමුවේ ඔබාමා පාලනාධිකාරය ලිහිල් භාවයක් පල කරන බවට රිපබ්ලිකානු දක්ෂිනාංශය වෙතින් විවේචනාත්මක ගිනි කුනාටුවක් පැන නංවා තිබේ.

හිටපු උපජනාධිපති ඩික් චෙනී බදාදා නිකුත් කල ප්‍රකාශයකින් මෙය ඉතා පැහැදිලිව ප්‍රකාශයට පත් විය.

"අපි ඉන්නේ යුද්ධයක, එහෙම නැහැයි කියලා ජනාධිපති ඔබාමා බොරුවට අඟවන එකෙන් වෙන්නේ අපි ආරක්ෂාව අතින් පහල අඩියකට වැටෙන එක," යි චෙනී කී ය. බුෂ් පාලනාධිකාරය සමයේ හිටපු උපජනාධිපති මෙන් ම "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" සැබෑ නායකයා ද වූ සිටි චෙනී, ගුවන්තනාමෝ සිර කඳවුර වසා දැමීමට සහ එහි නිලතල දැරූ ඇතැමුන්ට එරෙහිව සාමාන්‍ය ෆෙඩරල් උසාවිවල දී නඩු විභාග කිරීමට යෝජනා කිරීම ගැන ඔබාමාට තදින් දෝෂාරෝපනය කලේ ය. වොෂින්ටනය විදේශයන්හි ගෙන යන යුද්ධය හා රටතුල ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එරෙහිව එල්ල කරන ප්‍රහාර විස්තර කිරීමේ දී "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" යන වචන අතහැර දැමීම පිලිබඳව ද ඔහු එක්සත් ජනපද ජනාධිපතිවරයා හෙලා දැකීය.

අට වසරක් තිස්සේ රහස්‍ය ආන්ඩුවක කේන්ද්‍රීය පුද්ගලයාව සිටි, මිලිටරි-රහස් ඔත්තු යාන්ත්‍රනය සමග සමීප සම්බන්ධකම් ඇති, වධබන්ධන පැමිනවීමට, ඝාතනවලට සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් දැඩි ලෙස සීමා කිරීමට ද පක්ෂව නිර්දය ලෙස කතා කරන චෙනීගේ ප්‍රකාශවලින් හිඩැස් නොපුරවා වෙන් කර තැබීමට සහ ඒ මාර්ගයෙන් ත්‍රස්තවාදී ක්‍රියාවන්ට පහසුකම් සැපයීමට සීඅයිඒය තුලත් ඊට සම්බන්ධ ආයතන තුලත් සිටින කන්ඩායම් දිරිගැන්වෙන ආකාරයේ දේශපාලනික ගනන් බැලීම් මත ආලෝකය විහිදුවයි.

අබ්දුල්මුතලබ් හඳුනා ගන්නට ද නයිජීරියාවේ දී සහ යේමනයේ දී එලිදරව් වුනු තර්ජනය ගැන ආන්ඩුවේ අනෙකුත් ආයතනවලට අනතුරු අඟවන්නට ද අසමත් වීම පිලිබඳ වගකීම සීඅයිඒය මත පැටවීම වඩවඩාත් දැඩි කර තිබේ. සීඅයිඒ සංවිධානයේ ප්‍රමුඛයන් කී දෙනෙක් චෙනී සමග සමීප සබඳතා පවත්වන්නේ ද?

පාලක සංස්ථාපිතය සහ රාජ්‍යය තුල ප්‍රතිපත්ති සම්බන්ධයෙන් හට ගත් කටුක අරගලයන් තුල මෙම සිදුවීම තේරුම් කර ගැනීමේ මග වැටී තිබිය හැකි ය. බුෂ් පාලනාධිකාරයේ ප්‍රතිපත්ති අඛන්ඩව පවත්වා ගෙන යාමට ඔබාමා හැකි සියලු දේ කලත්, මුහුදින් එතෙර ආක්‍රමනකාරී යුද්ධය ද රට තුල පොලිස් රාජ්‍ය

බලතල වර්ධනය කිරීම ද සම්බන්ධයෙන් තවත් දුර යන්නට වුවමනා කරන කන්ඩායම් සිටියි.

අසාර්ථක වූ ගුවන් යානා බෝම්බ ප්‍රහාරය ගැන, සඳුදා ද අඟහරුවාදා ද ඔබාමා ප්‍රසිද්ධ ප්‍රකාශය නිකුත් කලේ ය.

"අපගේ ආන්ඩුව සතුව ප්‍රකට අන්තවාදියෙකු පිලිබඳ තොරතුරු තියෙද්දීත් ඒවා බෙදාහදා ගෙන විය යුතු පරිදි ක්‍රියා කරන්නේ නැහැ, ඒ නිසා ඒ අන්තවාදියා 300කට ආසන්න ජනයාගේ ජීවිතවලට හානි කරන්න පුලුවන්කම තියෙන භයානක පුපුරන ද්‍රව්‍ය අතේ ඇතිව ගුවන් යානයකට නැග ගන්නවා, පද්ධතිමය ඇන හිටීමක් හට ගෙන තිබෙනවා," යි හවායිහි සිට නිකුත් කල ප්‍රකාශයේ දී ඔබාමා පැවසී ය.

රහස් ඔත්තු සේවාවල ක්‍රියා පටිපාටිය පිලිබඳව "පරිපූර්න සමාලෝචනයක්" කරන ලෙස තමන් නියෝග කල බව ඔබාමා නිවේදනය කර දිනකට පසුව නිකුත් වූ දෙවන ප්‍රකාශයෙන් පිලිබිඹු වන්නේ වොෂින්ටන දේශපාලන සංස්ථාපිතය තුලත් එක්සත් ජනපද රහස් ඔත්තු සේවා තුලත් පවතින මතභේද හා එකිනෙකා මත දොස් පවරාගැනීමේ ප්‍රවනතාවයයි. එය ඔහුගේ පාලනාධිකාරය මතට කඩා පාත් වෙමින් තිබෙන ඉමහත් පීඩනයේ තරම ද සාර්ථක ත්‍රස්තවාදී ප්‍රහාරයකින් ඔහුගේ ජනාධිපතිකම මුලුමනින් ම අස්ථාවර වන ආකාරයේ බලපෑමක් සිදු වනු ඇති බව ඔහුට ඒත්තු ගොස් තිබීම ද පිලිබඳ ඇඟවුමකි.

බෝම්බ ප්‍රහාරය සිදු වනු දැකීමේ ද එම නිසා එය වලකනු ඇති රහස් ඔත්තු සේවාවන් මර්දනය කිරීමේ සහ ක්‍රියා පටිපාටි මග හැර යාමේ ද අවශ්‍යතාවෙන් පෙලුනු කන්ඩායම් එක්සත් ජනපද රාජ්‍යය තුල සිටින්නේ ද යන්න සලකා බැලීමෙන් තොරව, "නෝර්ත්වෙස්ට්" ගුවන් යානා බෝම්බ ප්‍රහාර කුමන්ත්‍රනය මෙතරම් දුරට දිග හැරෙන්නට ඉඩ සැලසුනේ කෙසේ ද යන්න ගැන බැරෑරුම් විමර්ශනයක් සිදු විය නොහැකි ය.

අබ්දුල්මුතලබ් පිලිබඳව ලද තොරතුරු ඇසින් දැක, පරෙස්සම් සහගත ව පරීක්ෂාකර අවශ්‍ය පියවර ගැනීම අවහිර කිරීමේ තීරනාත්මක තීන්දුව ගත් සුවිශේෂ පුද්ගලයන් කවුරුන් දැයි හඳුනා නො ගෙන මෙම ප්‍රශ්නවල පත්ලට කිඳා බැසිය නොහැකි ය.

"පද්ධතිය ඇන හිටී" යන මැයෙන් යුතු බදාදා කතුවැකියේ දී අබ්දුල්මුතලබ් පිලිබඳව රහස් ඔත්තු සේවාවලට ලැබුනු තොරතුරු සම්භාරයක් ම උපුටා දක්වන *නිව් යෝක් ටයිම්ස්* පුවත්පත, "අනතුරු ඇඟවීම ප්‍රමානවත් නොවූ බව නිලධාරීහු කියති" යි ලියයි. එය තව දුරටත් මෙසේ ද කියයි: "ගුවන් තොටුපලවල දී වඩා පරිපූර්න ආකාරයෙන් සෝදිසි කිරීම්වලට ලක් කල යුතු බවට නියම කර ඇති 14,000ක් ජනයාගේ නම් සහ තොරතුරු ඇතුලත් වන ලැයිස්තුවට ඔහු ඇතුලු කරන්නට තරම් අනතුරු ඇඟවීම ප්‍රමානවත් නො වේ යැයි නිලධාරීහු තීන්දු කලහ."

*ටයිම්ස්* පුවත්පත මෙම තීන්දු "නරක විනිශ්චයන්" යැයි නම් කරයි. හැම විට ම සිදු වන පරිදි මෙන් මෙහි දී ද, එක්සත් ජනපද ලිබරල් දේශපාලන සංස්ථාපිතයේ පරන පුරුදු මෙම හඬ නැගීම්වලින් බලාපොරොත්තු විය හැක්කේ අතිබරපතල කාරනාවක් සම්බන්ධයෙන් වඩාත් ම නොසැලකිලිමත් සහ නොබැරෑරුම් වන පැහැදිලි කිරීම සැපයීම පමනකි.

මෙම "නිලධාරීන්" කවුරුන් ද? ඔවුන් කවුරුන් දැයි නම් කල යුතු ය. එමෙන් ම, ඔවුන්ට චෝදනාපත්‍ර යැවිය යුතු ය, දිවුරුමට යටත් කොට ඔවුන්ගෙන් ප්‍රසිද්ධියේ ප්‍රශ්න කල යුතු ය, තමන් ගත් තීන්දු පැහැදිලි කරන ලෙස ඔවුන්ට බල කල යුතු ය.

වොෂින්ටනයේ රහස් ඔත්තු සහ ආරක්ෂක පද්ධතිවල ඇති වූ අතිමහත් වූ ද පැහැදිලි කල නොහැකි වූ ද "බිඳ වැටීමක්" ලෙස ගෙන හැර පානු ලබන දෙය නිරාවරනය කර ගැනීමේ හොඳ ම පෙරනිමිත්ත වන්නේ එක්සත් ජනපද භූමිය මත දී සිදු වන මහා ත්‍රස්තවාදී ප්‍රහාරයකින් දේශපාලනිකව වාසි සැලසෙනු ඇත්තේ කාට ද යන ප්‍රශ්නය ඇසීම යි.

බිල් වෑන් ඕකන්

© www.wsws.org